# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2423/34 - 2025 පෙබරවාරි මස 15 වැනි සෙනසුරාදා - 2025.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

MOD/DEF/HRM/01/AMD/REG.

එල්.ඩී.-බී 15/2016.

**යුද්ධ හමුදා පනත (357 වන අධිකාරය)**

(357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ 29 වන වගන්තිය සහ 155 වන වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**අනුර කුමාර දිසානායක,**
ආරක්ෂක අමාත්‍ය.

2025 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1988 ඔක්තෝබර් මස 21 වැනි දින අංක 528/15 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1987 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 22 වන නියෝගයෙහි -

(අ) (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් ;

(ආ) (ඈ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(ඈ) අධිකාරි ලත් සියලු නිලධාරිහු වයස අවුරුදු පනස් පහට (55) එළඹීම මත හෝ අවුරුදු විස්සක (20) සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත සේවයෙන් විශ්‍රාම ගත යුතු ය."; *සහ*

(ඇ) (ඉ) ඡේදයෙහි, "ඇයට අවුරුදු 50 එළඹෙන තුරු" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඇයට වයස අවුරුදු හැට (60) එළඹෙන තෙක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(2) එහි 38 වන නියෝගයෙහි (ඇ) ඡේදය ඉවත් කිරීමෙන්: සහ

(3) එහි 50 වන නියෝගය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"50. මේ නියෝගවල හෝ වෙනත් නියෝගවල කුමක් සඳහන් වුවද, යුද්ධ හමුදාපති විසින් අන්‍යාකාරයකින් විධානය කොට නොමැත්තේ නම්, වයස අවුරුදු හතළිස් පහට (45) එළඹීම මත හෝ අවුරුදු විසි දෙකක (22) කාලසීමාවක් සේවය කිරීම මත, සේවා කාන්තාවක් සේවයෙන් විශ්‍රාම ගත යුතු ය.".

EOG - 02 - 0133

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.